# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 2171635 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1705 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 12/11/2024<br>පැය 1505 |

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයක් - අනුරාධපුර පොලිස් වසම.

2024.11.12 වන දින අළුයම් කාලයේදී අනුරාධපුර පොලිස් වසමේ විජේපුර 09 ඇල පාර ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකුට උදැල්ලකින් පහරදීමෙන් මියගොස් ඇති බවට අනුරාධපුර පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ක් වූ වෙන්නප්පුව, කටුනේරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු විසින් ඝාතනය සිදු කරන ලද සැකකරුගේ බිරිඳට අතවර කිරීම සඳහා සැකකරුගේ නිවසට පැමිණ ඇති අවස්ථාවේදී සැකකරු විසින් මරණකරුට උදැල්ලකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. අනුරාධපුර පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - පොතුවිල් පොලිස් වසම.

2024.11.11 වන දින සවස් කාලයේ පොතුවිල් පොලිස් වසමේ පොතුවිල් අක්කරපත්තුව ඒ-4 මාර්ගයේ සිරියා හන්දිය ආසන්න ප්‍රදේශයේදී අක්කරපත්තුව දෙස සිට පොතුවිල් දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට ගොස් මාර්ගය අසල තිබූ කණුවක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත.

අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු පොතුවිල් රෝහලට ඇතුලත් කර ඇත. බරපතල තත්ත්වයේ පසු වූ යතුරුපැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා කල්මුණ රෝහල වෙත මාරු කර යවා ඇති අතර එහි ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 21 ක් වන පොතුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කල්මුණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - දංඔිවිට පොලිස් වසම.

2024.11.12 වන අද දින අළුයම් කාලයේ දංඔිවිට පොලිස් වසමේ කොළඹ නුවර මාර්ගයේ කිලෝමීටර් 51 කණුව හා 52 කණුව අතර ප්‍රදේශයේදී වරකාපොළ දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් කොළඹ දෙස සිට වරකාපොළ දෙසට ධාවනය වූ ලොරි රථයක මුහුණට මුහුණ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රීරෝද රථයේ රියදුරු ප්‍රතිකාර සඳහා වරකාපොල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වූ මීරිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වරකාපොල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර දංඔිවිට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය .

2024.11.11 වන දින දහවල් කාලයේදී ගම්පහ පොලිස් වසමේ ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 770ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන ගල්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**